# සමාජ සංවර්ධන පුවත් දේශපාලන ප්‍රතිරූප ගොඩනැංවීම සඳහා භාවිතා කරන අයුරු පිළිබඳ කරන මාධ්‍යමය අධ්‍යයනයක්.

## හැඳින්වීම

සමස්ත සමාජ රාමුවෙන් මිදී කොයිම අවස්ථාවකදීවත් මිනිසාට තම සිතැඟි පරිදි ජීවත් වීමේ හැකියාවක් නොමැත. නව සමාජ ගෝලීයකරණය එපමණටම ලොව සංකීර්ණ කර හමාරය. පුරාතනයේ ජනමතය පුරාණෝක්ති හරහා ගොඩනැඟුවා සේ පශ්චාත් නූතන යුගය වන විට එම ස්ථානය ජනමාධ්‍ය හිමිකරගෙන තිබේ. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලයට එහා ගොස් සිව්වන බලයක හිමිකාරීත්වය ගෙන ජනයාට විවිධ ආකාරයෙන් බලපෑම් කිරීමට අදවන විට ජනමාධ්‍යයට හැකි වී තිබේ. සිදුකරන අනේකවිධ බලපෑම් මඟින් විවිධාකාර වූ ප්‍රතිරූප ගොඩනැංවීම සිදුවේ. එම ප්‍රතිරූප හොඳ හෝ නරක විය හැකිය. පුද්ගල විඥානය නිසාම පුද්ගල ප්‍රතිරූපයන් සමාජ සන්දර්භය තුළින් ව්‍යුත්පන්න වේ. මෙම හෙළි කිරීමට නියමිත වටිනාකම් මත සමාජ සංවර්ධන පුවත් හරහා දේශපාලන ප්‍රතිරූපයන් ඒ ඒ ආකාරයෙන් පුවත්පත් තුළ ගොඩ නැඟේ යැයි සිතමි.

සංකීර්ණ සමාජ ව්‍යුහය තුළින් නිරන්තරවම දේශපාලන ප්‍රතිරූප ගොඩනැංවේ. එයට ජනමාධ්‍ය හරහා සිදුවන මෙහෙය අතිවිශාලය. නමුත් බොහෝ විට සිදුවන්නේ ව්‍යාජ ප්‍රතිරූප නිර්මාණය වීමකි. එය විවිධ කාලවකවානුවල විවිධ අයුරින් සමාජ, ආර්ථික, දේශපාලනික, විද්‍යාත්මක ප්‍රපංචයන් වශයෙන් සිදුවේ. විද්‍යුත් මාධ්‍ය පරයා ගොස් මුද්‍රිත මාධ්‍යය දැඩි විශ්වසනීයත්වයකින් සංවර්ධන පුවත් මඟින් දේශපාලන ප්‍රතිරූප ගොඩනැංවීමට උත්සාහ දරන අයුරු දැකිය හැකිය. අපේක්ෂිත අනාගතය මැවීමේ වගකීමෙන් එහාට ගොස් ජනමාධ්‍ය අදවන විට අධිතක්සේරුවක් මත සිට ප්‍රතිරූප ගොඩනැංවීම සිදුකරයි. එයට ප්‍රධානතම හේතුව නම් මුද්‍රිත හෝ වේවා කවර මාධ්‍යයක් ගත්තද දේශපාලන න්‍යාය පත්‍ර මත සිට කටයුතු කරන හෙයිනි. රජුන් බිහිකිරීමටත්, විනාශ කිරීමටත් විද්‍යුත්  මාධ්‍යයට සේම මුද්‍රිත මාධ්‍යයටද ඇති හැකියාව සුවිශේෂී වේ.

www.crx.sagepub.com සඳහන් පරිදි සංවර්ධනය යනු සමාජ, ආර්ථික, දේශපාලනික වූ අධ්‍යාත්මික හා භෞතික වෙනස්කම් කිසියම් ආකාරයකට දැන් තියෙන තත්ත්වයට වඩා වෙනස් තලයකට, ඉහළ තලයකට, ගුණාත්මකව වෙනස් තත්ත්වයකට පත් කිරීම බවයි.

එනම් ජනමාධ්‍යය හා විද්‍යුත් මාධ්‍යය ඔස්සේ "සංවර්ධනය " යන්න සමාජ ගතිකයන් ගොඩ නැගෙන ලෙස නිර්මාණයන විය යුතුය. සියලු දෙනාටම යහපත සලසන්නක් විය යුතුය. සංවර්ධනයේ ගතිකයන් හා සාක්ෂරතාවයන් නියෝජනය කරන අදහස් වලින් ජනවිඥානය හා චින්තනයද සංවර්ධනය විය යුතුය. සමාජයේ භෞතික හා අධ්‍යාත්මික සංවර්ධනය ඇතිවීම මෙයින් අපේක්ෂා කෙරෙයි. සම්ප්‍රදාය අගයමින් නව හැකියාවන් හා නව ජීවන රටාවන් මිනිසාට ලබා දීම මේ ඔස්සේ තව දුරටත් සිදුවේ.

අද සමාජයේ සංවර්ධනය උදෙසා ගන්නා ක්‍රියා මාර්ග අතර "අපි වවමු රට නගමු ", "සැමට පානීය ජලය" , "ගම නැගුම", "මග නැගුම", "ගැමි සැරිය", "සිසු සැරිය", "නිසිසැරිය", "රට නැගුම", "කෙතට දියවර" "තරුණ සංවර්ධන වැඩසටහන", "සුව සම්පත සුරකීම", "ග්‍රාමීය සෞඛ්‍ය සේවාවන් නගා සිටුවීම", "ක්‍රීඩා ශක්ති", "නැගෙනහිරට නවෝදය", "උතුරට වසන්තය" හා "නිල් අහස ජය ගැනීම" වැදගත් වේ. මේවා රජය ගෙන යන සංවර්ධන ව්‍යාපෘති වේ. එහෙත් "ජන සුවය" එතරම්ම ජනතාව අතරට යාම අඩුය. එනම් එයට ඍජු හෝ වක්‍ර ආකාරයෙන් දේශපාලනයට සම්බන්ධ වී ඇති බැවිනි. සමාජ ආර්ථිකයේ අධිකාරී ස්වරූපය උරුම කොට ගෙන ඇත්තේ රාජ්‍යයයි. රජය සතු බලය දේශපාලනික බලය වේ. "බලය බෙදා ගැනීම හා එහි ස්වරූපය තීරණය කිරීම සඳහා සිදු කෙරෙන අරගලය දේශපාලනය" බව හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ (1946) අදහසයි. සියල්ලේ ම ආධිපත්‍ය දරන දේශපාලනයෙන් වියුක්ත වී පුවතක් ගෙන ඒමට විද්‍යුත් මාධ්‍යයට සේම මුද්‍රිත මාධ්‍යයට ද හැකියාවක් නොමැත. ඒ අනුව බලන කල ප්‍රතිරූප යන්න දේශපාලන ක්ෂේත්‍රයට වැඩි අදාළ බවක් දරන අතර ඒ තුළින් ප්‍රතිරූපයක් ඇතිවීම කෙරෙහි වැඩි ප්‍රවණතාවක් දක්වයි. දියුණු තාක්ෂණික ක්‍රම උපායන් සහිතව විද්‍යුත් මාධ්‍ය ප්‍රබල ස්ථානයක සිටියද ඊට එහා ගිය සෑම ස්ථරයකම මිනිසාට ළංවීමේ හැකියාව පුවත්පත සතුව ඇත.

වෙබ්ස්ටර් ශබ්ද කෝෂයේ පුවත්පත අර්ථකථනය කරනුයේ අදහස් පළ කිරීමටත්, ආරංචි පළ කිරීමටත්, ප්‍රචාරයට නියමිත කාලවලදී සතිපතා හෝ දිනපතා පළ කරනු ලබන මුද්‍රිත පත්‍රය පුවත් වීමත් කාලීනව එය මහජනයාට අවශ්‍ය දැන්වීම් හා තොරතුරු පළ කරන්නට යොදා ගනු ලබන්නක් බවයි. අකර්ෂණීය තත්ත්වයන් උරුම කරගෙන සිටින එය වාර්තා, අක්ෂර, පින්තූර, අදහස් පාඨකයා පෙළඹවීම උදෙසා භාවිත කරයි. එමෙන්ම එහි ස්වාධීනත්වය දේශපාලන බලවතුන්ගේ ඇඟිලි ගැසීම්, විවිධ අනුග්‍රාහක ආයතන මත යැපීම්, මාධ්‍යයෙහි වගකීම ඔවුන් තේරුම් නොගෙන සිටීම, ආයතනයේ අඩු ලුහුඬුතා, පක්ෂ භේදයන්, බාධක, ආදිය මත විනාශ වී යයි. මුළු මහත් රාජ්‍යයක බලය හිමි පාර්ශවයන් නිර්මාණයට හා ඔවුගේ පැවැත්ම තීරණය කිරීමෙහි වැඩි බලයක් ජනමාධ්‍ය සතු වන අතර එකී නිර්මාණයන් මත සමාජ ක්‍රියාකාරීත්වයේ ස්වරූපය තිරණය වේ.

පුවත්පත් තුළ විනිවිද බව දේශපාලනික මතයන් හරහා විනාශ වී යයි. මයිකල් කුන්සිස්න් (2001) ඉනියෙල් ද සෝලාපුල් ට අනුව දියුණු වෙමින් පවතින රටවල ප්‍රගතිය සඳහා ජනමාධ්‍ය විධිමත්ව භාවිත කිරීමට බාධාවක්ව පවතින්නේ මේ කරුණු අරබයා එම රටවල පාලක පක්‍ෂය පැහැදිලි පිළිවෙත් තීරණ ගැනීමට අපොහොසත් වීම තුළ බවයි. සමාජ සංවර්ධනයට සිදුවන සමාජ බාධාකාරී සමාජ වාතාවරණයන් ඉවත් කරලීම හා සමාජ සංවර්ධනය ගැන දැනුවත් කිරීමේ දී දේශපාලන ප්‍රතිරූප ගොඩනැංවීම සිදුවේ. මාධ්‍ය තුළ පුද්ගල කේන්ද්‍රීය ප්‍රචාරණාත්මක වාර්තාකරණ භාවිත වන හෙයින් සමාජ සංවර්ධන පුවත් වාර්තාකරණය එක් එක් මාධ්‍යය තුළ විවිධාකාර ලෙස ක්‍රියාත්මක වේ. පුවත්පත් තුළ සමාජ සංවර්ධන පුවත් භාවිතය ද සුවිශේෂී වේ.

ජනමාධ්‍යය විෂය හදාරනු ලබන විද්‍යාර්ථියකු වශයෙන් මාගේ චින්තනයට හසුවන දෙයක් වනුයේ සංවර්ධන පුවත් හරහා දේශපාලන ප්‍රතිරූප ගොඩනැංවිය හැකි බවය. මේ බව තහවුරු කිරීම උදෙසා මා විසින් යොදා ගනු ලබනුයේ සති මැද, දිනමිණ, හා ලංකාදීප පුවත්පත්ය. මේ පුවත්පත් දෙකෙහි මතවාදය දෙයාකාර වූ නිසා එය සුවිශේෂී වේ යැයි සිතමි.

දිනමිණ පුවත්පතේ මුල්පිටුව, ඇතුළත එන පුවත් කොදෙව්ව, දකුණ සංවර්ධනය අතිරේකයෙහිද ලංකාදීප පුවත්පතෙහි පළාත් නාමයට වෙන් වූ අතිරේකයන් වන "පස්දුන් රට" "කොළොම්තොට" , "මාගම්" , ආදී අතිරේක වල ද, රජ වීදිය, මුල්පිටුව කාර්ටූන්, කාලීන වැඩසටහන්, පාර්ලිමේන්තුව විශේෂාංගය ද, බෝග වගා අතිරේකය, සඳුදා හමුව, ගුරුදා හමුව , ගොවි විශ්‍රාම වැටුප් අතිරේකය ආදියේ සංවර්ධන පුවත් පළ වේ. මේ පුවත් පත් දෙකෙන් දිනමිණෙහි සංවර්ධන පුවත් පළවන "දකුණු සංවර්ධනය" අතිරේකය හා ලංකාදීප පුවත්පතේ " මාගම්" අතිරේකය විශ්ලේෂණය සඳහා යොදා ගැනීමට නියමිතය. දේශපාලන ප්‍රතිරූප ගොඩනැංවීම යම් කාල පරාසයක සිදුවිය හැකි අතර මෙහිදී මා විසින් මාසයක කාලයක් තෝරා ගැනීම සිදුකෙරේ. ඒ සඳහා සැප්තැම්බර් මස තෝරාගත් අතර, එයට හේතුව වූයේ 2009 වර්ෂය පුරාවටම පළාත් සභා මැතිවරණ පැවතීමයි. ඒ හේතුවෙන් දේශපාලන ඡන්දයෙන් වියුක්ත කාල සීමාවක් තෝරා ගැනීම අපහසු විය.

ජනමාධ්‍යයෙන් දේශපාලනය ඉවත් කර නොහැක. මේ ප්‍රපංචයන් එකිනෙක වෙන් කිරීමට නොහැකි ලෙස සම්බන්ධ වී ඇත. සංවර්ධන පුවත් ද කාලීන පුවත් සේම මිනිසාට ළං වන්නේ විශ්වාසය, නිවැරදි බව, සමබර බව, තහවුරු කරමිනි. ඒ හරහා ගොඩ නැගෙන ප්‍රතිරූප ගැන බොහෝ අය කතා කරත්, සංවර්ධනය හරහා ගොඩනැගෙන වක්‍ර දේශපාලන ප්‍රතිරූප ගැන කවරෙකුවත් මෙතෙක් අධ්‍යයනයට ලක්කර නොමැත. උක්ත මාතෘකාවේ වැදගත්කම හා එකී අදාළ ක්ෂේත්‍රය කෙරෙහි මා තුළ වූ දැඩි රුචිකත්වය ද මෙම පර්යේෂණය සිදු කිරීමට මා යොමු කල කරුණු වෙයි. තවද මෙහි දී මාගේ උපකල්පනය සාක්‍ෂාත් කිරීම උදෙසා පහත න්‍යාය හා එහි භාවිතයන් ගෙන ඒමත් ක්‍රමවේදය ඔස්සේ සනාථ කිරීමටත් උත්සහ ගැනේ.